ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 අගෝස්තු මස 31 වන දින |

## කො.පා.මි.ද මත පදනම් වූ උද්ධමනය 2020 අගෝස්තු මාසයේ දී පහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 4.1%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.8%
- මාසික වෙනස : 0.0%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 3.2%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.8%
- මාසික වෙනස : 0.0%







කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 ජූලි මාසයේ පැවති සියයට 4.2හි සිට 2020 අගෝස්තු මාසයේ දී සියයට 4.1 දක්වා පහළ ගියේය. 2019 අගෝස්තු මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ජූලි මාසයේ පැවති සියයට 10.9හි සිට 2020 අගෝස්තු මාසයේ දී සියයට 12.3 දක්වා ඉහළ ගියේය. එසේ වුවද, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ජූලි මාසයේ පැවති සියයට 1.5හි සිට 2020 අගෝස්තු මාසයේ දී සියයට 0.8 දක්වා පහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස, 2020 අගෝස්තු මාසයේ දී සියයට 4.8ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

2020 අගෝස්තු මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.0ක් ලෙස වාර්තා විය. ආහාර කාණ්ඩයේ මිල ගණන්

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

සියයට 0.1කින් ඉහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ ඒ හා සමාන ප්‍රතිශතයකින් සිදු වූ මිල පහළ යෑම මගින් තුලනය වීම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2020 අගෝස්තු මාසයේ දී ආහාර කාණ්ඩයෙහි පොල්, එළවළු සහ කහ මිල ගණන්වල ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, නැවුම් මත්ස්‍ය සහ දෙහි මිල ගණන්වල සැලකිය යුතු පහළ යෑමක් මෙම මාසයේ දී වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයෙහි, සෞඛ්‍ය (වෛද්‍ය රසායනාගාර සඳහා ගෙවීම්) උපකාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්, 2020 අගෝස්තු මාසයේ දී පහළ ගියේය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, 2020 අගෝස්තු මාසයේ දී සියයට 3.2ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 ජූලි මාසයේ දී පැවති සියයට 4.0හි සිට 2020 අගෝස්තු මාසයේ දී සියයට 3.8 දක්වා තවදුරටත් පහළ ගියේය.

## දත්ත ඇමුණුම

**සංඛ්‍යා සටහන 01 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජූනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |
| | මැයි | 134.2 | 138.1 | 0.4 | 0.7 | 4.0 | 2.9 | 4.7 | 4.4 |
| | ජූනි | 135.3 | 138.6 | 0.8 | 0.4 | 3.9 | 3.1 | 4.7 | 4.2 |
| | ජූලි | 135.4 | 138.9 | 0.1 | 0.2 | 4.2 | 3.2 | 4.8 | 4.0 |
| | අගෝස්තු | 135.4 | 138.9 | 0.0 | 0.0 | 4.1 | 3.2 | 4.8 | 3.8 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව